සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

**11 ශ්‍රේණිය** අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2019 **15 S I**

**ක්‍රිස්තියානි ධර්මය - I** කාලය පැය එකයි

**සැලකිය යුතුයි :-** ● ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. ( නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න )

01. ''එම්මානුවේල් යන නාමය ඔහුට තබන්නේය'' යන ප්‍රකාශය සිදු කළ දිවසිවරයා වන්නේ දිවසිවර,
    1. ජෙරමියාය. 2. මීකාය. 3. යෙසායාය. 4. මලාකිය.

02. පිලිප් විසින් ඉතියෝපීය වැසියාට පහදා දුන් කරුණ වන්නේ ජේසුස් වහන්සේගේ,
    1. පරිත්‍යාගශීලී සේවකත්වයයි. 2. ස්වර්ගාරෝහණයයි.
    3. එතුමාගේ උපත හා ළමා වියයි. 4. ප්‍රාතිහාර්යන් ගැනය.

03. ''ඔහු මව්පියන් හා දරුවන් සමගි කරන්නේය'' යන අනාවැකිය ගාබ්‍රියල් දේව දූතයා විසින් ප්‍රකාශ කරන ලද්දේ,
    1. පාවුල් තුමා ගැනය. 2. ජේසු තුමා ගැනය. 3. ස්නාවක ජොහාන් ගැනය. 4. මරිය තුමිය ගැනය.

04. දේව සැළැස්මට අවනත වූ ජෝසප් මරිය තුමියව,
    1. ප්‍රතික්ෂේප කලේය. 2. රැකබලා ගත්තේය. 3. රහසින් අත්හැරියේය. 4. නිවසින් පලවා හැරියේය.

05. ගව ඔරුවක බාවා සිටින බිළිදෙක් සලකුණු කොට ගැලවුම් කරුවා සොයා ගියේ,
    1. එඬේරුන්ය. 2. රජ වරුන්ය. 3. හෙරෝද්ය. 4. දේව දූතයන්ය.

06. සිමියොන් යන නමෙහි අර්ථය වන්නේ,
    1. ''දේව දායාදයයි''. 2. ''දෙවියන් වහන්සේ ඇසූ සේක'' යන්නය.
    3. ''ආලේප ලත් තැනැත්තාය''. 4. ''දෙවියන් වහන්සේ අප සමඟය'' යන්නය.

07. ස්නාවක ජොහාන් තුමා ප්‍රකාශ කරන පරිදි දෙවියන් වහන්සේට ආබ්‍රහම් වෙත දරු පරපුරක් ලබා දිය හැක්කේ,
    01. දූවිල්ලෙනි 02. ජලයෙනි. 03. ගල් වලිනි. 04. අහසෙනි.

08. ජේසුස් වහන්සේගේ සුභ අස්න ප්‍රකාශ කිරිමේ මෙහෙවර ආරම්භ කරන ලද්දේ,
    01. ජෙරුසලම් මාලිගාවෙනි. 02. නාසරෙත් ධර්ම ශාලාවෙනි.
    03. ගලීල මුහුදෙනි. 04. ජෝර්දාන් ගඟෙනි.

09. සෙබෙදිගේ පුතුන් දෙදෙනා වන්නේ,
    01. සීමොන්න් හා අන්දෘය. 02. සිමියොන් සහ ජාකොබ්ය.
    03. ලෙවී හා තෝමස්ය. 04. ජාකොබ් හා ජොහාන්ය.

10. ''ව්‍යවස්ථාවේ බිංදු මාත්‍රයක් වත් අහෝසි වී යැමට වඩා පහසු වන්නේ,
    01. ''ලෝකය පහල වීමය'' 02. ''අහස පොළොව පහව යෑමය''
    03. ව්‍යවස්ථාව කඩ කිරීමය'' 04. ''විමුක්තිය ලබා දීමය ''

11. සද්දුසිවරුන්ගේ කේන්ද්‍රස්ථානය වන්නේ,
    01. නාරසෙන් දෙව් මැදුරය. 02. ජෙරුසලම් දේව මාලිගාවය.
    03. ජුදා රාජ්‍ය සභාවය. 04. ප්‍රාදේශීය ධර්ම ශාලාවය.

12. ජේසුස් වහන්සේ පරිසිවරුනට අවධාරණය කළේ,
    01. ප්‍රේමයෙන් තොරව ආගමික පිළිවෙත් වලට ගැතිවීමේ නිසරු බවය.
    02. ආගමික පුද පූජා පැවැත්වීමේ වැදගත්කමයි.
    03. පිගානද කෝප්පයද සේදීමේ වැදගත් කමයි.
    04. බාහිර හා අභ්‍යන්තර පිරිසිදු කමේ ප්‍රතිපලය.

13. එකල දේව මාලිගාවේ බද්ද ගෙවීමට භාවිතා කලේ,
1. රුපියල්ය . 2. තඹ කාසිය. 3. රන් කාසිය. 4. දිනාර්ය.

14. ''ඔබ දෙවියන් වහන්සේගේ ක්‍රිස්තුවරයාණෝය'' යැයි සාක්ෂි දැරුවේ,
1. ස්නාවක ජොහාන්ය. 2. පාවුල් තුමාය . 3. තෝමස් තුමාය. 4. පේදුරු තුමාය.

15. හේවායිනි විසින් ජේසුස් වහන්සේ අල්ලා ගැනීමට පෙර එතුමා කළ ශ්‍රාවකයන්ගෙන් අවසාන වශයෙන් ඉල්ලා සිටියේ,
1. සතුරන් ඉදිරියේ පලා යන ලෙස ය. 2. පරීක්ෂාවට නොවැටෙන පිණිස යාච්ඤා කරන ලෙස ය.
3. සතුරා සමඟ සටන් කරන ලෙස ය. 4. තම මව්පියන් රැකබලා ගන්නා ලෙස ය.

16. ක්‍රිස්තු අනුගාමිකයෙකු ලෙස ප්‍රසිද්ධියේ පෙනී සිටිමින් සත්‍යයට සාක්ෂි දරූ ජුදා මන්ත්‍රණ සභාවේ සාමාජිකයා වන්නේ,
1. කිරේනියේ සීමොන්ය. 2. අරිමාතියේ ජෝසප්ය.
3. කයාපස්ය. 4. අන්නස්ය.

17. හිස් වූ සොහොන වෙත ගොස් ජේසු තුමාගේ උත්ථානය ගැන සත්‍යතාවය තහවුරු කර ගත්තේ,
1. පාවුල් තුමාය. 2. පිලාත්ය. 3. පේදුරුය. 4. නායක පූජකයන්ය.

18. රූප විපර්යාසය සිදු වීමේදී ජේසුස් වහන්සේගේ තේජශ්‍රීය ප්‍රකාශ වූ සංකේත වන්නෙ ,
A - උන් වහන්සේගේ මුහුණ වෙනස් වීමය. B - මෝසෙස් දර්ශනය වීම.
C - අහසින් හඬක් ඇසීම. D - වස්ත්‍ර ධවල කාන්තියෙන් බැබලීම.
1. A සහ C 2. B සහ D 3. A සහ B 4. A සහ D

19. ජේසුස් වහන්සේ තම ගොලයන්ට පෙන්වා දුන් පරිදි එතුමාගේ සේවය සම්පූර්ණ වීමට යා යුතු නගරය වන්නේ,
1. ජුදයයි. 2. බෙත්ලෙහෙමය. 3. ජෙරුසලමය. 4. මිසරයය.

20. රෝම අධිරාජ්‍යයට සේවය කරමින් තම ජාතියට එරෙහි වූවන් ලෙස සලකා පීඩාවට ලක් වූ ජන කණ්ඩායම නම්,
1. සමාරීය ජාතීන්ය 2. යුධ සෙබළුන්ය 3. විජාතීන්ය 4. අයකැමියන්ය.

21. ජේසුස් වහන්සේ සිදු කළ ආශ්චර්යයක් දැක ගැනීමට කැමැත්තෙන් සිටියේ,
1. අන්නස්ය 2. හෙරෝද්ය 3. පිලාත්ය. 4. මාර්ථාය.

22. ''සෙමෙයොන්'' යන ග්‍රීක වචනයේ අර්ථය වන්නේ,
1. දේව බල සළකුණුය 2. ප්‍රාතිහාරයන්ය. 3. ස්වභාදහමය. 4. උපමාව ලබා දීමයි''

23. ජේසුස් වහන්සේ විසින් මරණින් නැගිට වීමෙන් තුළින් සංකේතවත් කළේ,
1. ජීවිත දානයේ වැදගත් කමයි. 2. ජීවිතයේ අස්ථිර බවයි.
3. ශුද්ධාත්ම බලයයි. 4. නව ජීවිතයක් ලැබීමයි.

24. ස්භාදහම අභිබවා ජේසුස් වහන්සේ විසින් කරන ලද ප්‍රාතිහාරයක් වන්නේ,
1. මන්නා ලැබීමයි. 2. මහා මංගල භෝජනයයි.
3. පන්දහසකට කෑම දීමයි. 4. ලෙවී කැඳවීමයි.

25. ජේසුස් වහන්සේ විසින් වැන්දඹුවගේ පඩුර අගය කළේ,
1. අඩු මුදලක් පරිත්‍යාග කළ නිසාය.
2. ඇය රන්කාසි දමූ නිසාය.
3. ධනවතුන්ට වඩා ඇගේ පඩුර වටිනාකමින් වැඩි නිසාය.
4. තම දිවි පෙවෙත සඳහා තිබූ සියල්ල පරිත්‍යාග කල නිසාය.

26. දෙවියන් වහන්සේ විසින් ආසිරි පැතීමේ නාමයක් ලෙස ආනාවරණය කලේ,
1. ආදම්ගේ නාමයයි. 2. දේව පුත්‍රයාගේ නාමයයි.
3. මරිය තුමියගේ නාමයයි. 4. ආබ්‍රහම්ගේ නාමයයි.

27. දේව කැමැත්තට අවනත නොවන්නන්ගේ ජීවිත,

1. ජයග්‍රහණය කරා යොමු වේ.
2. විනාශය හා අනතුරු කරා ගමන් කරයි.
3. ස්වාධීන ගමන් මාර්ගයකට පිවිසෙයි.
4. ස්වර්ගය මාර්ගය කරා යොමු වේ.

28. ඉශ්‍රායල් ඉතිහාසයේ ආලේප ලත් පූජකයන් වන්නේ,

1. ජෙරුසලමේ නායක පූජකයන්ය.
2. මිසරයේ පාරාවෝය.
3. ආරෝන් ඔහුගේ පුතුන්
4. දාවිත් හා ජොස්සේය.

29. ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් වලට අනුව අපගේ අසල්වැසියා වන්නේ,

1. අප වටා සිටින විවිධ අවශ්‍යතාවයන්ගෙන් පෙළෙන අය.
2. අප රටේ වෙසෙන දුගී ජනතාව
3. අප සමඟ නිතරම සුහදශීලීව සිටින අය.
4. මිතුරන් හා නෑදෑ හැතවතුන්

30. ''කිසිවෙක් තමාට ස්වාමියාණෝ කියා නොගන්න. නායකයා සේවකයා විය යුතුය'' යන පදනමින් සේවය කළේ,

1. මාර්ටින් ලූතර් කිංය.
2. චන්ද්‍රා ප්‍රනාන්දු පියතුමාය.
3. මහත්මා ගාන්ධිය.
4. මයිකල් රොද්‍රිගෝ පියතුමාය.

31. පාවුල් තුමා එපීස වරුනට යවන ලද සංදේශයට අනුව ධර්මිෂ්ඨ ජීවිතයක් උරුම වීමට අවශ්‍ය ගුණාංගය නම්,

1. දයාවයි
2. ප්‍රිතියයි.
3. ඇදහිල්ලයි
4. පරිත්‍යාගයයි.

32. දෙවිවරු මිනිස් වෙසින් අප වෙත බැස සිටිති. මෙම ප්‍රකාශය කරන ලද්දේ,

1. නාරරෙත්හි ජනතාව.
2. ලුස්ත්‍රාවේ ජනතාව.
3. පිලිප්පියේ සිරකරුවන්.
4. ඇතන්ස්හි ජනතාව.

33. පාවුලු තුමා සිරියාවට යන අතර තුරේදී හිස මුඩු කර ගත්තේ,

1. වරදකරුවෙකු වූ නිසා.
2. භාරයක්ව සිටි නිසා.
3. රජුගේ අණ නිසා.
4. බාර්ණබස්ගේ ඉල්ලීම නිසා.

34. ජේසුස් වහන්සේ නැමැති ජීවන ජාලයට ඇති පිපාසාව තුළින් අපට උරුම වන්නේ,

1. දහම් දැනුමයි.
2. දේව රාජ්‍යය.
3. තෘප්තියයි.
4. සහනයයි.

35. ආත්මයාණන් වහන්සේගේ මඟ පෙන්වීම තුළ හැසිරෙන්නා,

1. නිවැරදි මාර්ගය මඟ හැර යයි.
2. නිරන්තරයෙන් නමස්කාරයේ යෙදෙයි.
3. මානසික තෘෂ්ණා වලට වසඟ නොවේ.
4. අන් අයගේ අප්‍රසාදයට ලක් වේ.

36. එපීස සංදේශයට අනුව දරුවන්ගේ වගකීම වන්නේ,

A - මහලු දෙමව්පියන්ට රැකවරණය ලබා දීමයි.
B - සමිඳාණන් තුළ දෙමාපියන්ට කීකරු වන්න.
C - ඔබේ මවටත් පියාටත් ගෞරව කරන්න.
D - ඔබේ මව්පියන් විවේචනය කිරීමෙන් වළකින්න.

මින් වඩාත් නිවැරදි වන්නේ,

1. A සහ B
2. A සහ C
3. C සහ D
4. B සහ C

37. සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැගීමට නම්,

1. ස්වර්ගීය සම්පත් කෙරෙහි සිත යෙදවීම වැදගත් වේ.
2. සමාජ සිරිත් විරිත් ගැන දැනුවත් විය යුතුය.
3. රට තුළ සමාජ සේවා දියුණු කල යුතුය.
4. සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය.

38. පැරණි ගිවිසුම තුළ ලඹ ලනුව පිලිබඳ දර්ශනය ඉදිරිපත් කරන්නේ,

1. දිවසිවර ආමොස්ය.
2. දිවසිවර එලියාය.
3. දිවසිවර ජෙරමියාය.
4. ජෙරමියාය.

39. පහත සඳහන් ප්‍රකාශ අතරින් දාවිත් රජුගේ අයදීමක් වන්නේ,

1. ''සමිඳුනි මා තුළ නිර්මල සිතක් මවා වදාළ මැනව'' යන්නය.
2. ''යහපතින් අයහපත වෙන් කර ගැනීමේ හැකියාව දුන මැනව'' යන්නය.
3. ''යුක්තිය ගලා බසින දිය දහරාවක්ද ධර්මිෂ්ඨකම නොසිඳී ගලන ගගක් මෙනි'' යන්නය.
4. ''මම නැති වූ බැටළුවා සොයන්නෙමි'' යන්නය.

40. ''එකිනෙකා තම තමාගේ මිදි වැල යටද අත්තික්කා ගස යටද යෙහෙන් වාසය කරයි'' මීසා දිවසිවරයා මෙසේ ප්‍රකාශ කරන්නේ,

1. කෘෂි කර්මාන්තයේ දියුණුව ගැනය.
2. මිදි හා අත්තික්කා වගාවේ වැදගත්කම ගැනය.
3. සමෘර්ධිමත් කමේ ස්වභාවය ගැනය.
4. ජුදෙව්වන්ගේ පැරණි චාරිත්‍රයක් ගැනය.

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

**11 ශ්‍රේණිය** අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2019 **15 S II**

**ක්‍රිස්තියානි ධර්මය - II** **කාලය පැය දෙකයි**

**සැලකිය යුතුයි :- ● පළමු ප්‍රශ්නය අනිවාර්යය වන අතර ඉතිරි ප්‍රශ්න අතුරින් 4ක් තෝරාගෙන සියලුම ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.**

01. ස්නාවක ජොහාන් තුමාගේ එඩිතර බව හා නිහතමානි බව දක්වෙන ප්‍රකාශයන් දෙකක් ලියන්න.
02. ජේසුස් වහන්සේ ධර්මදූත සේවය සඳහා පිටත් කරන ලද ශ්‍රාවකයන්ට පවරන ලද වගකීම් දෙකක් ලියන්න.
03. දේව රාජ්‍යයේ වර්ධනය පිළිබඳව ජේසුස් වහන්සේ වදාළ උපමා දෙකක් ලියන්න.
04. ''ඔබත් ගොස් එසේම කරන්න'' ජේසුස් වහන්සේ මේ වදන් පැවසුවේ කාටද? ''එසේ කරන්න'' යන අභියෝගය කුමක්ද?
05. එදිනෙදා අවශ්‍යතාවල ඇලී ගැලී කරදර වන්නට ජේසුස් වහන්සේ පෙන්වා දුන් නිදර්ශක දෙක ලියන්න.
06. දෙවි පියාණන් විසින් ආබ්‍රහම්ට දෙන ලද පොරොන්දු දෙකක් ලියන්න.
07. දෙවියන් වහන්සේ කෙරෙහි තිබුණා වූ ඇදහිල්ල නිසා දුක් විදීමට දායක වූ පුරාණ ගිවිසුමේ චරිත දෙකක් ලියන්න.
08. පිලිප්පි නගරයේදී පාවුල් තුමා මුහුණ දුන් අත්දැකීම් දෙකක් ලියන්න.
09. ජෙරුසලම් මන්ත්‍රණ සභාව විසින් ගන්නා ලද තීරණ දෙකක් ලියන්න.
10. තම පාපි බව තේරුම්ගත් යෙසායා දිවසිවරයා කැඳවීමේදී දුන් පිළිතුර කුමක්ද?

02. 1. දිවසිවර යෙසායා ප්‍රකාශ කරන පරිදි පැමිණෙන්නට සිටින තැනැන් වහන්සේගේ රාජ්‍යයේ ප්‍රධාන ගුණාංග දෙක ලියන්න.
    2. ක්‍රිස්තු උපත ගැන ගාබ්‍රියල් දේව දූතයා මරිය තුමියට ලබා දුන් අනාවැකි 3ක් ලියන්න.
    3. පුරාණ ගිවිසුමේ සඳහන් පරිදි ජේසුස් වහන්සේ තම සේවයේ අරමුණු ඉටුකර ගත් ආකාරය නව ගිවිසුමකට අනුව නිදසුන් 05කින් විස්තර කරන්න.

03. 1. දේව රාජ්‍යයේ ලකුණු හෙවත් ප්‍රාතිහාර කාණ්ඩ දෙකක් නම් කරන්න.
    2. දේව රාජ්‍යයට අදාළ සේවක නායකත්වය ජේසුස් වහන්සේ සිය ජීවිතාදර්ශයෙන් සිදු කල අවස්ථා තුනක් ලියන්න.
    3. රන් කාසි දසය පිළිබඳ උපමාවෙන් දේව රාජ්‍යයේ පුරවැසියන්ට ලැබෙන මගපෙන්වීම් පහක් ලියන්න.

04. 1. "මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවා" යයි ජේසුස් වහන්සේ ප්‍රකාශ කළේ කුමන අවස්ථාවේද? එයින් ලැබෙන මගපෙන්වීම කුමක්ද?
    2. ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තියට සම්බන්ධ පුද්ගලයන් තිදෙනෙකු නම් කර එම අවස්ථාවේදී ඔවුන් දක් වූ ප්‍රතිචාර ලියන්න.
    3. ජේසුස් වහන්සේගේ ජීවමාන බව අත්දැකීමට අද අපට ඇති බාධා 05ක් විස්තර කරන්න.

05. 1. පාවුල් තුමා සමඟ පළමු ධර්මදූත චාරිකාවේදී හවුල් නායකත්වය සඳහා කදවනු ලැබූවන් දෙදෙනෙක් නම් කරන්න.
    2. පාවුල් තුමාගේ සිත් හැරීමට පෙර එතුමා කිතුනුවන් කෙරෙහි ක්‍රියා කළ ආකාරය නිදසුන් තුනකින් පෙන්වා දෙන්න.
    3. එතුමාගේ සිත් හැරීමේ අත්දැකීම් තුළින් අපගේ ජීවිත වලට ලැබෙන ආදර්ශ 5ක් ලියන්න.

06. 1. දැඩි පීඩනයට හා සූරා කෑමට ලක් වූ දිළිඳු ජනතාව ගැන ආමොස් දිවසිවරයා කළ ප්‍රකාශය කුමක්ද?
    2. අයුක්තිය හා අසාධාරණත්වය අරුත් සුන් පුද පූජා හා විනිශ්චය ගැන අමෝස් දිවැසිවරයා කළ ප්‍රකාශයන් මොනවාද?
    3. ආමොස් දිවසිවරයාගේ පණිවුඩ තුළින් ඔබගේ ජීවිතයට ලැබෙන ආදර්ශ 05ක් විස්තර කරන්න.

07. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් තෝරාගෙන බයිබලීය කරුණු ඇසුරෙන් කෙටි සයටහන් ලියන්න.
    1. පාවුල් තුමා සිරකරුවෙකු ලෙස සාක්ෂි දැරීම.
    2. මුල් කිතුණු සභාවේ ක්‍රියාකාරිත්වයෙන් ලැබෙන ආදර්ශ
    3. සද්දුසිවරු ජේසුස් වහන්සේට යොමු කළ ප්‍රශ්න
    4. ස්තුතිවන්ත බව

# තෙවන වාර පරීක්ෂණය - 2019
## ක්‍රිස්තියානි ධර්මය
## පිළිතුරු පත්‍රය

11 ශ්‍රේණිය

| | | | |
|---|---|---|---|
| 01. 3 | 11. 2 | 21. 2 | 31. 3 |
| 02. 1 | 12. 1 | 22. 1 | 32. 2 |
| 03. 3 | 13. 2 | 23. 3 | 33. 2 |
| 04. 2 | 14. 4 | 24. 3 | 34. 2 |
| 05. 1 | 15. 2 | 25. 4 | 35. 3 |
| 06. 2 | 16. 2 | 26. 4 | 36. 4 |
| 07. 3 | 17. 3 | 27. 2 | 37. 1 |
| 08. 2 | 18. 4 | 28. 3 | 38. 1 |
| 09. 4 | 19. 3 | 29. 1 | 39. 1 |
| 10. 2 | 20. 4 | 30. 2 | 40. 3 |

01. 1. හෙරෝද් රජු ගේ වැරදි ක්‍රියා එඩිතරව ප්‍රකාශ කිරීම, නිහතමානි බව, මට වඩා ආනුභව සම්පන්න උතුමෙකු එන්නේය. එතුමාගේ පාවහන් පටි මුදන්නට වත් මම නොවටිමි. එතුමාණන් ශුද්ධාත්මයාණන් ගෙන් ද, ගින්නෙන් ද බව්තීස්ම කරනු ලබයි.

2. යක්ෂයාගේ බලය හා ආධිපත්‍ය කෙරෙහි බලය පෑම / රෝග සුව කිරීම / දේව රාජ්‍ය ප්‍රකාශ කිරීම.

3. අඹ ඇටයේ උපමාව / මුහුන් පිළිබඳ උපමාව / වපුරන්නාගේ උපමාව

4. උන් වහන්සේ පරීක්ෂා කිරීමට පැමිණි විනයධරයාට / කිසිදු භේදයකින් තොරව අන් අයට දයාව දැක්වීම.

5. කපුටන් හා මානෙල් මල

6. විශාල ජාතියක පියා බවට පත්වීම / දේශයක් උරුම කර දීම / අන්‍යයන්ට ආශිර්වාදයක් වීම.

7. ජොබ් හා ජෙරමියා දිවැසිවරයා

8. ලිදියා හා ඇගේ නිවසේ සියලු දෙනා බව්තිස්මය ලැබීම / වහල් තරුණියට නිදහස දීම / නඩුකාරයා ඉදිරියට ගෙන යෑම හා ඔවුන්ව තලා සිර ගෙයි දැමීම / සිර ගෙයි මුලාදෑනියාගේ නිවසේ සියල්ලන් බව්තීස්මය ලැබීම.

9. රූප නමස්කාරයෙන් වැළකීම / කාම මිත්‍යාචාරයෙන් වැළකීම / බොටුව මිරිකා මැරූ සතුන්ගේ මස් කෑමෙන් වැළකීම.

10. තමා කාලකණ්නියෙක් බවත් අපවිත්‍ර තොල් ඇති සෙනග අතරේ සිටින බව ප්‍රකාශ කිරීම.

02. 1. යුක්තිය හා ධර්මිෂ්ඨකම

2. උන් වහන්සේ ශ්‍රේෂ්ඨ වන සේක. / පරමෝත්තමයාණන්ගේ පුත්‍රයාණෝ යයි කියනු ලබන්නෝය / උන් වහන්සේගේ පිය වූ දාවින්ගේ සිංහාසනය දෙවි ස්වාමින් වහන්සේ උන් වහන්සෙට ප්‍රදානය කරන සේක / උන් වහන්සේ ජාකොබ්ගේ වංශය කෙරෙහි සදහටම රජකම් කරන සේක. උන් වහන්සේගේ රාජ්‍ය කෙලවරක් නොදක්නේය

3. දිළිඳුන්ට හා පීඩිතයන්ට සුභ අස්න දේශනා කළ සේක / සමාජය පිළිකුල් කල ලාදුරු රෝගීන්ට සුවය දානය කිරීම / පව්කාර ස්ත්‍රීන්ට සමාව දීම / මුදලට වහල් වූ සාකේවූස්ට මීදීම දානය කිරීම ආදී විස්තර කර ඇති නිදසුන් සඳහා ලකුණු ලබා දෙන්න.

03. 1. සුව කිරීම / අශුද්ධාත්ම දුරු කිරීම් / ස්භාවධර්මය අභිබවා කළ ක්‍රියාවන් / මරණින් උත්ථාන කිරීම්.

2. කුඩා දරුවෙකු අගය කිරීම / සේවය අවශ්‍ය අයගේ නිවෙස් වෙත ගොස් සේවය ඉටු කිරීම / ශ්‍රාවකයන්ගේ පාද සේදීම / බොහෝ දෙනෙකුගේ මිදීම වෙනුවෙන් ජීවිතය පරිත්‍යාග කිරීම.

3. සුළු දෙයක් පිළිබඳ විශ්වාසවන්ත විය යුතුය / තම කැඳවීමට නිසි ප්‍රතිචාර දැක්විය යුතුය/ තම හැකියාවන් අන් අයගේ යහපත සඳහා යොදා ගනිමින් දේව රාජ්‍යය වෙනුවෙන් කැප වීම / දෙවියන් වහන්සේට ප්‍රසන්න වන අයුරින් මුළු හදවතින්ම කැප වීම / තම වගකීම් වෙනත් අයට පැවරීමේ අවදානමින් බැහැරව ක්‍රියා කිරීම.

04. 1. ඔලීව කන්දේ යාච්ඤාවේදී ජේසුස් වහන්සේ ප්‍රකාශ කල සේක. තම කම සම්පූර්ණයෙන් බැහැර කර දේව කැමැත්තට අවනත වීම.

2. සිරේනියේ සීමෝන් - නොසිතූ මොහොතක ජේසුස් වහන්සේගේ කුරුසය දැරීමට ඇරයුම් ලැබිය හැකි වීම / ස්ත්‍රීන් - ජේසු තුමාගේ කුරුස පත්වීම පරාජයක් නොව ජයග්‍රහණයක් බව / සොරුන් - ජීවිතයේ අවසන් මොහොතේ වුවද වරද පිළිගැනීම තුළ සදාතන දිවිය උරුමවන බව / මුර සෙබළුන් - අපට පැමිණෙන පරීක්ෂාවන් හිදී දේව වචනය තුළ ශක්තිමත් වීම / අරිමාතියේ ජෝෂප් - සත්‍යට සාක්ෂි දැරීම.

3. උන් වහන්සේගේ ජීවමාන බව කෙරෙහි විශ්වාසයක් නොමැති වීම. අප බලාපොරොත්තු නොවන ස්වරූපයන් හේ අවස්ථාවක උන් වහන්සේ අපට මුණ ගැසීම / අප ජීවිත තුළ පවතින සැකය හා වියවුල දේව අභිප්‍රායෙන් බැහැරව පාපායට යොමු වීම, අන් අයගේ බලපෑම් ආදී සිසුන් ලියා ඇති පිළිතුරු සඳහා ලකුණු ලබා දීම.

05. 1. බාර්ණබස් හා ජොහාන් මාර්ක්

2. ස්තේපන්ට ගල් ගැසූවන්ගේ වස්ත්‍ර රැකබලාගැනීම / ස්තේපන්ගේ මරණය ගැන සතුටු වීම / පුරුෂයන් අල්ලා සිරගත කිරීමට උත්සහ කිරීම / කිතුනුවන්ට මරණ තර්ජන එල්ල කිරීම /කිතුණු ස්ත්‍රීන් පුරුෂයන් අල්ලා ධර්ම ශාලාවට ගෙන ඒමට අවසර පත්‍රයක් ලබා ගැනීම.

3. විවිධ තත්වයන් තුළදී දේව සේවය සඳහා තෝරා ගන්නා බව / කුමන තත්වයකදී වුවද දේව කැඳවීමට කීකරු වීම / අපගේ පෞද්ගලික තීරණ වලට වඩා දෙවියන් වහන්සේගේ තීරණ ක්‍රියාත්මක වන බව / දෙවියන් වහන්සේ ගේ මෙහෙය වීමට ඉඩ හැරීම. (පිටු අංක 50 අනු පිළිතුරු සඳහා ලකුණු ලබා දීම)

06. 1. ''දුප්පතා සල්ලි වලටද, දුගියා සෙරෙප්පු දෙකක මිලටද ගත හැකිය ''

2. අයුක්තිය හා අසාධාරණය - දිළිදුන් තලා පෙළා පීඩා කරන්නන්ට විනිශ්චය දරුණු ලෙස පැමිණෙන බව / අරුත් සුන් පුද පූජා හා මංගල්‍යයන්ට දෙවියන් වහන්සේ ද්වේශ කරන බව / විනිශ්චය අයුක්තිය අසාධාරණ කරන්නන් විනිශ්චයට ලක් කරන බවත් දුප්පතුන්ගේ පැත්ත ගනිමින් ඔවුන් ආරක්ෂා කරන බවත්

07. 1. කුණාටුව පිළිබඳ දැනුවත් කිරීම / පාවුල් තුමාගේ සාක්ෂිය තුළ ශක්තිමත් කිරීම / ඔහුගේ සාක්ෂිය නිසා අනතුරක් නොවූද ඔහු දේවත්වයෙන් පවා ජනතාව සැළකීම / අතීසාරයෙන් පෙළුන දිවයිනේ ප්‍රධානියාගේ පියා සුව කිරීම / අර්බුද හා අභියෝග හමුවේ එඩිතර ව මුහුණ දීම. (ක්‍රියා 27.21 - 26 / ක්‍රියා 28. 1-10)

2. දිනපතා එක් සිත්ව දේව මාලිගාවේදී යාච්ඤා කිරීම / ගෙයින් ගෙට ගොස් යාච්ඤා කිරීම / සහභාගීකමේ පැවැත් වීමෙන් / නිරන්තර යාච්ඤාවෙන් කල් ගත කිරීම / ඉගැන්වීම් සිදු කිරීම / දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීම දේව බය හා ගෞරවයෙන් කල්ගත කිරීම / සහනාධාර ලබා දීම.

3. අධිකරණ බලය ගැන ප්‍රශ්නය ලූක් 20:1-8 / බදු ගෙවීමේ ප්‍රශ්නය ලූක් 20:19-26 / පුනර්ජීවනය ගැන ප්‍රශ්නය ලූක් 20:27-40

4. ස්තුතිවන්ත බව ලූක් 17:11-18